ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල | மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் | Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය | தாபனமும் நிறுவாக பிரிவு | Establishment and Administration Division

මගේ අංකය / எமது இலக்கம் / My No: NWP/CS/AD/4/1/28/2027 ඔබේ අංකය / உமது இலக்கம் / Your No: දිනය / திகதி / Date: 2026.09.30

ලේකම්, වයඹ ප්‍රධාන අමාත්‍යාංශය.
ලේකම්, වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය.
ලේකම්, වයඹ පළාත් මාර්ග අමාත්‍යාංශය.
ලේකම්, වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය.
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා).
පළාත් පාලන කොමසාරිස්, වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව.
පළාත් ඉංජිනේරු අධ්‍යක්ෂ, වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව.
අධ්‍යක්ෂ, වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
පළාත් අධ්‍යක්ෂ, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව.
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව.
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**<u>වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027</u>**

2027 වර්ෂය සඳහා වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බැවින් පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඔබ ආයතනයේ 2026.12.31 දිනට පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී නිලධාරීන් ලවා මේ සමඟ අමුණා ඇති ස්ථාන මාරු අයදුම්පත්‍රය (ඇමුණුම 01) සම්පූර්ණ කරවා ගෙන 2026.10.30 දිනට පෙර ඔබගේ නිර්දේශය ද සමඟ අදාළ කඩඉම් මඟින් මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

2.1 වයඹ පළාත් සභා රාජ්‍ය සේවය තුළ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරීන් (III/II/I/ විශේෂ ශ්‍රේණි) සහ සැලසුම් ශිල්පී නිලධාරීන් (III/II/I/ විශේෂ ශ්‍රේණි) අතරින්,

i. මුල් පත්වීම ලැබී වසර 03 ක අවම සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ට ඉල්ලුම් කල හැකි අතර, වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් එම නිලධාරීන්ගේ කැමැත්ත මත පමණක් ස්ථාන මාරු කිරීම.

ii. ස්ථාන මාරු ක්‍රියාත්මක වන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 55ට අඩු නිලධාරීන්. (වයස අවුරුදු 55ට වැඩි වුවද නිලධාරියාගේ ඉල්ලීම අනුව වාර්ෂික ස්ථාන මාරුවලදී සලකා බැලිය හැක.)

2.2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති.

i. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළ නියමිත කාලය සම්පූර්ණ වන නිලධාරීන් සඳහාය.

ii. වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දි සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලැබූ ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.



ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel: 037-2231769-72, Fax: 037-2222234, e-mai: csnwp@sltnet.lk, Web site: www.cs.nw.gov.lk
ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — Tel: 037-2223777, Fax: 037-2228019, e-mail: csnwp@sltnet.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) — Tel: 037-2223195, e-mail: depcsnwp@sltnet.lk

iii. වාර්ෂික ස්ථාන මාරුවලට යටත්වන නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් මෙහි අංක 2.1 හි සඳහන් විධිවිධාන යටතේ වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

iv. වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධාරීන් තමන් ස්ථාන මාරු වී යාමට කැමති උපලේඛනයේ දක්වා ඇති දෙපාර්තමේන්තු 03ක්, සිය මනාපය පරිදි අනුපිළිවෙලින් අයදුම්පත්‍රයේ නම් කළ යුතුය.

v. යම් සේවා ස්ථානයක සේවා කාලය ගණන් ගැනීමේ දී වැටුප් රහිත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල සීමාවන්ද, විනය හේතු හෝ වෙනත් හේතු මත සේවයේ යෙදී නොසිටි කාල සීමාවන්ද හැර, නිලධාරියාගේ සක්‍රිය සේවා කාලය පමණක් ගණන් ගනු ලැබේ.

vi. වාර්ෂික ස්ථාන මාරු නිවේදන නිකුත් කල දින සිට වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය දක්වා අන්තර් පළාත් ස්ථාන මාරු සහ විනය නියෝග මත සිදු කරන ස්ථාන මාරු සහ දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර ස්ථාන මාරු හැර අනෙකුත් සියලු ස්ථාන මාරු අත්හිටුවිය යුතුය. එසේ වුවද එම කාලය තුළදී රාජකාරීමය වශයෙන් උද්ගතවන අත්‍යවශ්‍යම කරුණකදී ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත පමණක් ස්ථාන මාරුවීම් සිදුකිරීම සලකා බැලිය හැකිය.

vii. නියමිත දිනට ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකරන, චුවමනාවෙන්ම ස්ථාන මාරු අයදුම්කිරීම පැහැර හරින, අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන නිලධාරීන් ස්ථාන මාරු මණ්ඩලය විසින් දෙනු ලබන ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට යටත් විය යුතු අතර ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

viii. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරු දිනය වන අතර, ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධරයෝ, නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථාන වෙත වාර්තා කිරීමට බැඳී සිටිති.

ix. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් කිරීමට හැකිවන පරිදි නියමිත කාලය තුල අභ්‍යන්තර ස්ථාන මාරු නිම කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

x. ස්ථාන මාරු මණ්ඩලය විසින් සලකා බැලිය යුතු කරුණු හා ඒ අනුව ලකුණු ලබා දීමකින් අනතුරුව ප්‍රමුඛතාගත කළ ස්ථාන මාරු ලේඛනය ඉදිරිපත් කළ යුතුය.

xi. ප්‍රධාන ලේකම් කාර්යාලය හෝ පළාත් දෙපාර්තමේන්තුවක ඒකකයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද, එම සේවා කාලය එම ආයතනයේ සේවා කාලය ලෙස ගණනය කරනු ලැබේ.

03. වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් සලකා බලනු ලබන කරුණු.

i. සේවයේ නියුතු කාර්මික නිලධාරීන් සංඛ්‍යාවෙන් උපරිම 1/5 කට පමණක් ස්ථාන මාරු ක්‍රියාත්මක කෙරේ.

ii. වර්තමාන දෙපාර්තමේන්තුවේ සේවා කාලය පදනම් කරගෙන වසරකට ලකුණු 02 බැගින් ලබාදෙනු ලැබේ.

iii. සේවා කාලය තුළ සේවය කළ වර්තමාන දෙපාර්තමේන්තුව හැර සේවය කළ වෙනත් දෙපාර්තමේන්තුවක සේවා කාලය වසරකට ලකුණු 01 බැගින් ලබාදෙනු ලැබේ.

iv. සේවා කාලය තුළ සේවය නොකළ දෙපාර්තමේන්තුවකට ඉල්ලුම් කරන්නේ නම්, ලකුණු 05ක් ලබාදෙනු ලැබේ.

v. ඉහත ලකුණු ලබාදීම අනුව ස්ථාන මාරු ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ලැබේ.

04. අයදුම්පත් ඉදිරිපත් කිරීම.

i. මේ සමඟ ඇති "ආකෘති අංක 01" අනුව වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කඩඉම් නිර්දේශ සහිතව නියමිත දිනට පෙර වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

ii. මේ සමඟ අමුණා ඇති "ආකෘති අංක 02" අනුව ඔබ ආයතනයේ වසර 03 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳව සාරාංශයක් ද, "ආකෘති අංක 03" අනුව ස්ථාන මාරු අයදුම් කර ඇති ඔබ ආයතනයේ වසර 10 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් පිළිබඳ විස්තරයක්ද ඉදිරිපත් කල යුතුය.

iii. ඔබ ආයතනයේ වසර 03 හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් අතුරින් විශේෂ රාජකාරී /විශේෂ පුහුණුවක් ලබා විශේෂ පුහුණුවක් ලබා විශේෂ ව්‍යාපෘතියක සේවයේ නියුතු නිලධාරීන් සිටී නම් ඔවුන් සම්බන්ධව ස්ථාන මාරු අයදුම්පත් "ඇමුණුම 04" ආකෘතිය අනුව වෙනම ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය.

05. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් කිරීමට හැකිවන පරිදි නියමිත කාලය තුල අභ්‍යන්තර ස්ථාන මාරු නිම කිරීමෙන් පසුව **වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වීමට බලාපොරොත්තු වන නිලධාරීන්ගේ අයදුම්පත් පමණක්** ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

06. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය හා ස්ථාන මාරු සම්බන්ධ අනෙකුත් සියළු උපදෙස් වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් (www.cs.nw.gov.lk) බාගත කර ගත හැක.

07. වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ 257 වගන්තිය අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරන අතර, ඉහත උපදෙස් අනුගමනය කර මෙම වාර්ෂික ස්ථාන මාරුවීම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඔබගෙන් ලැබෙන සහාය අගය කොට සලකමි.

අයි.එම්.අයි. ඉලංගකෝන්,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

## වයඹ පළාත් සභාවේ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරීන් හා සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත - 2027

**01. පෞද්ගලික තොරතුරු**

1.1. සම්පූර්ණ නම : ..............................................................................................................

1.2. මුලකුරු සමඟ නම : ..........................................................................................................

1.3. ජාතික හැඳුනුම්පත් අංක : ........................................

1.4. උපන් දිනය : ........................................

1.5. වයස (2026 දෙසැම්බර් මස 31 දිනට) :

අවු: .............. මාස:.......... දින:........

1.6. ස්ත්‍රී/ පුරුෂ භාවය : ........................

1.7. ස්ථිර පදිංචි ලිපිනය : ..........................................................................................................

..........................................................................................................

1.8. තාවකාලික ලිපිනය (ඇත්නම්) : ..........................................................................................

..........................................................................................................

1.9. විවාහක/ අවිවාහක බව : ....................................

1.10. කලත්‍රයාගේ නම : ..........................................................................................................

1.11. කලත්‍රයාගේ රැකියාව හා වර්තමාන සේවා ස්ථානය : ..........................................................

..........................................................................................................................

1.12. දරුවන් ගණන : .........................

1.13. දරුවන්ගේ වයස : ..........................................................................................................

1.14. දරුවන් ඉගෙනුම ලබන පාසල් : ..........................................................................................

..........................................................................................................................

1.15. ආබාධිත / විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටී ද යන්න සහ සිටී නම් ඒ පිළිබඳ තොරතුරු :

..........................................................................................................................

1.16. සම්බන්ධ කරගත හැකි දුරකතන අංක:

කාර්යාලය: ............................ ජංගම: .............................. නිවස: ..........................

**02. සේවා තොරතුරු**

2.1. මුල් පත්වීම් දිනය : ........................ තනතුරු නාමය : ............................................

2.2. වර්තමාන සේවා ස්ථානය : ..........................................................................................

2.3. වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය : ..................................................

2.4. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.12.31 දිනට)

අවු: .............. මාස:.......... දින:........

2.5. පංතිය/ ශ්‍රේණිය : ........................................................

2.6. ඔබ විසින් ලබා ඇති විශේෂ පුහුණු පිළිබඳ විස්තර : ..................................................................

..................................................................................................................................

..................................................................................................................................

2.7. පූර්ව සේවා ස්ථාන.

| ප්‍රධාන ලේකම් කාර්යාලය / දෙපාර්තමේන්තුව / ඒකකය | සේවා ස්ථානය | සේවය කළ කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**03. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන.**

(ඔබේ මනාපය පරිදි අනුපිළිවෙලින් සේවා ස්ථාන 03 ක් නම් කළ යුතුය.)

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කාර්යාලය | දෙපාර්තමේන්තුව | කාර්යාලයීය ලිපිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

**04. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව. ( අදාල පිළිතුර සළකුණු කරන්න)**

4.1 නියමිත සේවා කාලය ඉක්මවීම. ☐

4.2 වෙනත් විශේෂ හේතු (හේතුව සදහන් කළ යුතුය.) ☐

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

මා විසින් ඉහත සදහන් කර ඇති සියලු තොරතුරු සත්‍ය බව සහතික කරමි.

දිනය : ..................................                ..................................................

නිලධාරියාගේ අත්සන

**05. ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ/ නිර්දේශය.**

ඉහත නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව නිර්දේශ කරමි/ නොකරමි. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට නිලධාරියා/ නිලධාරිනිය නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය : ..................................                ..................................................................

අත්සන සහ නිල මුද්‍රාව

**06. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.**

ඉහත සඳහන් ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව නිර්දේශ කරමි/ නොකරමි.

දිනය : ................................ ..................................................................

අත්සන සහ නිල මුද්‍රාව

**07. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය.**

ඉහත සඳහන් ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව නිර්දේශ කරමි/ නොකරමි.

දිනය : ................................ ..................................................................

අත්සන සහ නිල මුද්‍රාව

## සේවා ස්ථාන

| | |
|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා ) |
| අමාත්‍යාංශය | ප්‍රධාන අමාත්‍යාංශය<br>යටතේ පවතින ජල හා සනීපාරක්ෂක ඒකකය |
| දෙපාර්තමේන්තුව | වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| | වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව |
| | වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| | වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව |

ආකෘති අංක 02

....................................

....................................

....................................

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
වයඹ පළාත.

**වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරීන් හා සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(වසර 03 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්)**

පහත නම් සඳහන් නිලධාරීන්/ නිලධාරිනියන්ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ / නිලධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/ සහිතව / පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

මගේ ආයතනයේ/ කාර්යාලයේ වසර 3 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සියළු දෙනාගේ තොරතුරු ඇතුලත් කොට ඇති බව තහවුරු කරමි.

දිනය - ........................

...........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ආකෘති අංක 03

....................................

....................................

....................................

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
වයඹ පළාත.

**වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරීන් හා සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(වසර 10 ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්)**

පහත නම් සඳහන් නිලධාරීන්/ නිලධාරිනියන්ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ / නිලධාරිනියගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/ සහිතව / පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ........................

..........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ආකෘති අංක 04

....................................

....................................

....................................

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
වයඹ පළාත.

**<u>වයඹ පළාත් සභාවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරීන් හා සැලසුම් ශිල්පී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027</u>**

**<u>(විශේෂ රාජකාරී/විශේෂ පුහුණුවක් ලබා විශේෂ ව්‍යාපෘතියක නියුතු නිලධාරීන්)</u>**

පහත නම් සඳහන් නිලධාරීන්/ නිලධාරිනියන්ගේ ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | නිලධාරියාගේ / නිලධාරිනියගේ නම | ලබා ඇති විශේෂ පුහුණුව | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/ සහිතව / පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ........................

..........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා